# භාරතය හින්දුවීම හා මුස්ලිම් නොවීම

අප මෙතෙක් කී දඹදිව භාරතය වීම ගැන කී කතාව මෙසේ සම්පිණ්ඩනය කළ හැකි ය. අවුරුදු පන්දහසකට වැඩි කලක් තිස්සේ දඹදිව අනාර්ය සංස්කෘතියක් තිබුණි. මොහෙන්ජදාරෝ හරප්පා සංස්කෘතිය ද එවැන්නකි. ඒ සංස්කෘතියෙහි පුරාවිද්‍යාත්මක නටබුන්වල කාශ්‍යප බුදුන්වහන්සේගේ සසුනෙහි තොරතුරු ද දැකගත හැකි යැයි ඇතැම් උගතුන්ගේ ලේඛන කියවූ විට සිතාගැනීම අපහසු නො වේ.

ආර්යයන් ලෙස හැඳින්වෙන්නන් දඹදිවට පැමිණීමට සියවස් කිහිපයකට පෙර යක්ෂ ගෝත්‍රිකයන් පර්සියාවට බටහිරින් වූ ප්‍රදේශයකින් හෝ බටහිර පර්සියාවෙන් හෝ දඹදිවට පැමිණ ඇත. ඔවුන්ගෙන් ඇතැමකු ලංකාවට ද පැමිණ පදිංචි වී ඇත. යක්ෂ ගෝත්‍රිකයන්ගෙන් ඇතැම්හු ජෛන ආගම ඇදහූ බව ද ඔවුන්ගේ ඉන්ද්‍ර වැනි දෙවියන් ජෛන මුනිවරුන් ආරක්ෂා කළ බව ද පෙනී යයි. එමෙන් ම දඹදිව බහුදේවාදික වූ බව හා සසර, කර්මය වැනි අදහස් හා සංකල්ප ආර්යයන් පැමිණීමට පෙර එහි තිබූ බව ද පැහැදිලි ය. ආර්යයෝ වෙනත් සංස්කෘතියක් දඹදිවට ගෙන ආහ. ඔවුහු ඒක දේවවාදීන් වූ අතර යාග හෝම බලි බිලි පූජා ඔස්සේ විමුක්තිය ලබාගැනීමට කටයුතු කළහ. යුද්ධ දක්ෂයන් වූ ඔවුන්ට දඹදිව මුල දී බටහිර හා වයඹ ප්‍රදේශවලත් පසුව අනෙක් ප්‍රදේශවලත් දේශපාලන ආධිපත්‍යයක් පිහිටුවා ගැනීමේ අපහසුතාවක් නො වී ය. ඔවුන් තම සංස්කෘතිය දඹදිව පුරා ව්‍යාප්ත කිරීමට උත්සාහ ගත්තේ පළමුව හා මූලිකව දේශපාලන ආධිපත්‍යය ඔස්සේ ය.

මුල දී ඔවුන්ට තම සංස්කෘතික ආධිපත්‍යය තාවකාලික ව පිහිටවා ගැනීමේ අපහසුතාවක් නොතිබෙන්නට ඇත. එහෙත් දඹදිව එවකටත් තිබූ සංස්කෘතිය ආර්යයන්ගේ සංස්කෘතික ආධිපත්‍යයට එරෙහිව ප්‍රතිචාර දැක්වීමට පටන්ගත්තේ ය. ආර්ය සංස්කෘතියට දඹදිව තිබූ සංස්කෘතිය පරාජය කිරීමට නොහැකි විය. දේශපාලන ආධිපත්‍යය තිබුණ ද සංස්කෘතික ආධිපත්‍යය පිහිටුවීම පහසු කාර්යයක් නොවන බව ඉතිහාසයේ පෙන්නුම් කරන පළමු අවස්ථාව හෝ අවසන් අවස්ථාව හෝ ඒ නොවන බව තේරුම්ගත යුතු ය.

සංස්කෘතිය, ආර්ථිකය හා දේශපාලනය එකිනෙක සමග බැඳී තිබුණ ද එකිනෙකෙහි යම් ස්වාධීනත්වයක් ද ඇත. දඹදිව විශේෂයෙන් ම නැගෙනහිර හා ඊසාන දිශාවල පැරණි සංස්කෘතිය යටපත් නො වී ය. එහි සංස්කෘතිය විසින් කාලයක් දඹදිව තිබූ ජෛන දහම මහාවීර මුනිවරයාණන් මගින් නැවත පුනරුත්ථාපනය කෙරුණු අතර කාශ්‍යප බුදුන්වහන්සේගෙන් පසුව නැවත බුදුදහම ද පෙරට ගැණිනි. වෙනත් වචනවලින් කිවහොත් දඹදිව නැවතත් බුදදහම පහළවිය. බුදු දහම හා ජෛන ආගම ශ්‍රමණ සම්ප්‍රදායෙන් බිහි වූ ධර්ම වෙයි. ශ්‍රමණ සම්ප්‍රදාය විසින් බලි බිලි යාග හෝමවලට විරුද්ධව කටයුතු කෙරුණු අතර ක්‍රමයෙන් අහිංසාව ආර්ය සංස්කෘතියට ඇතුළත් කරගන්නා ලදී. ඒ අතර දඹදිව කලක සිට වැජඹුණු ශිව විෂ්ණු , ක්‍රිෂ්ණ ආදී දෙවිවරු ද යක්ෂ ගෝත්‍රිකයන්ගේ ඉන්ද්‍ර වැනි දෙවිවරු ද ආර්ය දේව කුලකයට ඇතුළත් කරගනු ලැබුණි. ඒ ඒ දෙවිවරුන් විසින් උසුලන ලද සමාජ තත්වය අනුව මෙසේ ආර්ය සංස්කෘතියට ඇතුළත් කරගනු ලැබූ අනාර්ය දෙවිවරු ආර්ය දේව ධුරාවලියේ ඒ ඒ තැන්වල පිහිටුවනු ලැබූහ.

ශිව, විෂ්ණු ඊශ්වර දෙවිවරු එකතු වී ඒක දේව බ්‍රහ්මන්ගේ ත්‍රිමූර්තිය බවට පත් වූ අතර ක්‍රිෂ්ණ වැනි දෙවිවරු විෂ්ණුගේ අවතාර බවට පත්වූහ.. වෛදික ආගම් ඇතිවූයේ මේ මිශ්‍රණයේ ප්‍රතිඵලයක් ලෙස ය. පසු කලෙක බුදුන් වහන්සේ ද විෂ්ණු දෙවියන්ගේ අවතාරයක් ලෙස සැලකිණි. එහෙත් සෑම අනාර්ය දෙවි කෙනකු හා දේවතාවියක ආර්ය දේව ධුරාවලියට ඇතුළත් කරගත්තා නො වේ. උදාහරණයක් ලෙස ඉන්ද්‍ර දෙවියන් වෛදිකයන්ගේ ප්‍රධාන දෙවි කෙනකු බවට පත්වුණ ද, එතුමාගේ භාර්යාව වූ ඉන්ද්‍රාණි නම් දෙවඟනට, එනම් යක්ෂණියට එවැනි තත්වයක් හිමි නොවිණි. වෛදිකයන් යක්ෂයනට වඩා යක්ෂණියන් අප්‍රිය කළ බවක් පෙනෙන්නට ඇත. ලංකාවේ කුවේණිය ගැන පවා ලියැවී ඇත්තේ දැඩි විරෝධාකල්පයකිනි. ඒ හුදු ස්ත්‍රී විරෝධයක් යැයි සැලකිය නොහැක්කේ ලක්ෂ්මී වැනි දෙවඟනන් වෛදික දේව කුලකයෙහි ප්‍රධාන තැනක් හිමිකරගන්නා බැවිනි. ආර්ය සංස්කෘතියෙහි යක්ෂණියන්ට එරෙහිව තදබල විරෝධයක් ගොඩනැගී ඇත්තේ ඔවුන් ඉතා රූමත් හා පුරුෂයන් වසඟකිරීමෙහි ලා අතිශයෙන් සමත් ස්ත්‍රීන් වීම නිසා විය හැකි ය. යක්ෂණියන් හේතුකොටගෙන තම පුරුෂයන් නැතිවේවිය යන බිය ආර්යයන්ට තිබෙන්නට ඇත.

© Prof. Nalin De Silva

වෛදික සංස්කෘතියට ඇතුල් වුයේ දඹදිව පැරණි සංස්කෘතියේ ව්‍යවාහාරික අංග පමණක් නො වේ. ශාස්ත්‍රීය වශයෙන් ද බොහෝ දෑ වෛදික සම්ප්‍රදාය විසින් අවශෝෂණය කෙරිණි. ජෝෂි (Joshi) මහතා සහ වෙනත් අය පෙන්වා දෙන පරිදි ආරණ්‍යයක ග්‍රන්ථවල සිට ම වේද ග්‍රන්ථවලට දඹදිව පැරණි දැනුම ඇතුළත් වී ඇත. උපනිෂද් කාලය වන විට මේ තත්වය වැඩි දියුණු වී ඇති බව ඔවුන්ගේ පිළිගැනීම ය. වෛදික සංස්කෘතිය යනු හුදෙක් ආර්ය සංස්කෘතියක් නොව දේශපාලන ආධිපත්‍යය ද නොතකා දඹදිව අනාර්ය සංස්කෘතීන් ආර්ය සංස්කෘතිය බොහෝ තැන්වල දී පැරදවීමේ ප්‍රතිඵලයක් ලෙස බිහිවුවකි. එහෙත් ආර්ය සංස්කෘතියෙහි ඇතැම් කරුණු වෛදික සංස්කෘතියෙහි ප්‍රධාන අංග බවට ද පත් වී ඇත. ආත්මවාදය, බ්‍රහ්මන් හෙවත් ඒක දේවවාදය (ශිව , විෂ්ණු ඊශ්වර ත්‍රි මූර්තියෙන් සංශෝධිත ව වුව ද), කුල වාදය හෙවත් වර්ණ භේදය, පුරුෂාධිපතිත්වය ආදිය මුළුමනින් ම පරාජය කිරීමට බෞද්ධ සංස්කෘතියට වුව ද නො හැකි විය.

එපමණක් නො වේ. ආර්යයන් විසින් දඹදිව සංස්කෘතියට හඳුන්වා දෙන ලද වියුක්ත ප්‍රවාද නිර්මාණය ද පරාජය නො විණි. බුදුන්වහන්සේ වියුක්ත ප්‍රවාද නිර්මාණ තැනීමෙහි ලා උනන්දුවක් නො දැක්වූහ. එයට හේතුව කුමක් වුවත් ඇතැම් භික්ෂූන් වහන්සේ වියුක්ත ප්‍රවාද නිර්මාණයෙහි ලා උනන්දු වූහ. විශේෂයෙන් ම බ්‍රාහ්මණ වංශයෙහි ඉපිද  පැවිදි වූ ඇතැම් භික්ෂූන් වහන්සේට වියුක්ත ප්‍රවාද නිර්මාණය ගිහි සංස්කෘතියෙන් ම හුරු විය. උන්වහන්සේලා ඒ කාර්යය බුද්ධ ශාසනය තුළට ම ගෙන ආහ. හීනයාන, මහායාන සම්ප්‍රදාය දෙකෙහි ම ප්‍රවාද ගොඩ නැගූ භික්ෂූන් වහන්සේ සිටියහ. ථෙරවාදයේ ක්ෂණවාදය, කාලය, පරමාණුව ආදී සංකල්ප වර්ධනය විය. මහායානයේ ආලය විඥානය, ශූන්‍යතාව ආදී සංකල්ප වර්ධනය විය. එහෙත් ප්‍රවාද නිර්මාණයෙහි ම භයානක පැත්තක් වෙයි. ප්‍රවාද නාම පද මුල්කරගෙන නිර්මාණය වෙයි. නාමපදයක් යනු කිනම් අර්ථයකින් ගත්ත ද, අවසන් වශයෙන් ගත්කල ආත්මවාදී වෙයි. ආත්මවාදය මුල්කර නොගෙන නාමපදයක් ගැන සිතිය නො හැකි ය. සූර්යයා කීව ද, ආත්මය කීව ද, නිවන කීව ද, ක්ෂණය යැයි කීව ද, පරමාණුව යැයි කීව ද, ආලය විඥානය යැයි කීව ද, ශූන්‍යතාව යැයි කීව ද, එතැන ආත්ම සංකල්පයක් වෙයි.

භික්ෂූන් වහන්සේලා ආත්මයක් නැතැයි කීම සඳහා ප්‍රවාද නිර්මාණය කිරීමට යැමේ ප්‍රතිඵලය වූයේ උන්වහන්සේලා ද අවසන් වශයෙන් ගත්කල ආත්මවාදයෙහි ම කොටු වීම ය. ආලය විඥානය, ක්ෂණවාදය පමණක් නොව ශූන්‍යතාව ද ආත්මවාදී විම වැළැක්විය නො හැකි ය. අපට මෙයින් ඉගෙන ගත හැකි මහඟු පාඩමක් වෙයි. බටහිර දැනුම් ආධිපත්‍යයට එරෙහිව ඒ පරාජය කිරීම සඳහා අපට ප්‍රවාද නිර්මාණය කිරීමට සිදුවෙයි. එහෙත් අප කිසි දිනෙක ආත්මයක් නැතැයි කීමට හෝ අනිත්‍ය දුක්ඛ අනාත්ම නිවන සඳහා හෝ ප්‍රවාද නිර්මාණය කිරීමට අත නොගැසිය යුතු ය. අප අනිත්‍ය දුක්ඛ අනාත්ම නිවන සංකල්ප ලෙස ගැනීමෙන් ම වැළකිය යුතු ය.

අවසානයේ දී ශංකරාචාර්යයෝ නාගර්ජුනපාදයන් වහන්සේගේ ශූන්‍යතාව වෛදික ආගම්වලට අවශෝෂණය කරමින් නිර්ගුණ බ්‍රහ්මන් සහිත අද්වෛත වේදාන්තය  නිර්මාණය කළහ. අනාර්ය සංස්කෘතියෙන් එසේ බොහෝ දෑ අවශෝෂණය කිරීමෙන් ආර්යයන් පැමිණ සියවස් ගණනාවක ඇවෑමෙන් දඹදිව භාරතය බවට ද වෛදික ආගම් හින්දු ආගම බවට ද පත්විය. මුස්ලිම්වරුන් භාරතයට පැමිනෙන විට එහි ථෙරවාදයක් නො වී ය. ඇතැම් තැන්වල මහායානය තිබූ අතර තවත් තැන්වල මහායානය ද හින්දු බවට පත්වී තිබුණි. ථෙරවාදය මෙන් නොව මහායානය ආත්මවාදයට හා හින්දු ආගමට සමීප ය.

මුස්ලිම්වරුන් මහායානය පමණක් නොව භාරතයේ ඇතැම් තැන්වල හින්දු ආගම ද විනාශ කිරීමට කටයුතු කෙළේ ආයුධ බලයෙනි. එනම් දේශපාලන ආධිපත්‍යය පිහිටුවීමෙනි. එහෙත් මුස්ලිම් ආක්‍රමණිකයන්ට මුළු භරතය පුරා ම මුස්ලිම් සංස්කෘතිය පැතිරවීමේ හැකියාවක් නො වී ය. තමන් විසින් දේශපාලන ආධිපත්‍යය පිහිටුවා ගන්නා ලද ප්‍රදේශවල පවා පූර්ණ සංස්කෘතික ආධිපත්‍යයක් ගොඩනගා ගැනීමට මුගල් අධිරාජ්‍යයට වුව ද නොහැකි විය. මෙයින් පැහැදිලි වන කරුණක් වෙයි. යුරෝපීයයන් නොපැමිණය ද භාරතය මුළුමනින් ම මුස්ලිම් කිරීමට මුස්ලිම් පාලයකයන්ට නොහැකිවීමට තිබුණි.

මේ කියමන අද ඊනියා පරීක්ෂණයකට භාජනය කළ හැක්කක් නො වේ. යුරෝපීයයන්ට නැවතත් යුරෝපයට යැමට කියා අද ඉන්දියාවෙන් යුරෝපීය සංස්කෘතිය අතුගා දමා මුස්ලිම් පාලනයක් ඇතිකර සිදුවන්නේ කුමක් දැයි නිරීක්ෂණය

© Prof. Nalin De Silva

කළ හැකි නො වේ. එබැවින් ඒ ප්‍රකාශය ඊනියා විද්‍යාත්මක විධික්‍රමයක් අනුගමනය කරමින් කරන ලද්දක් නො වේ යැයි ඇතැමකු කියනු ඇත. එහෙත් එයින් පැහැදිලි වනුයේ ඊනියා විද්‍යාත්මක විධික්‍රමයකින් සියල්ල අධ්‍යයනය කළ නොහැකි බව පමණ ය. සමස්තයක් ලෙස ගතහොත් විකාශයක් ඇති තැනක ඊනියා විද්‍යාත්මක පරීක්ෂණ කළ හැකි නො වෙයි. ඊනියා විද්‍යාත්මක පරීක්ෂණයක් නැවත නැවත කළ හැකිව තිබිය යුතු ය. නැවත නැවත කිරීමට නම් පද්ධතිය විකාශය නොවිය යුතු ය. එසේත් නැතහොත් යම් කාලයක විකාශය නොවන, වෙනස් නොවන පද්ධති සම්බන්ධයෙන් පමණක් ඊනියා විද්‍යාත්මක පරීක්ෂණ කළ හැකි ය. ඒ අරුතින් ගත්කල ඊනියා පරීක්ෂණ කළ නොහැක්කේ ඉතිහාසය සම්බන්ධයෙන් පමණක් නො වෙයි. ඩාවින්ගේ පරිණාමවාදය ද පරීක්ෂණයට හසු නො වෙයි. එපමණක් නො වේ. විශ්වයේ විකාශය ගැන ද පරයේෂණ කළ නො හැකි ය. ඒ තාරකා භෞතිකයේ පරයේෂණ කිරීමට ඇති නොහැකියාවට අමතර ව ය.

දකුණු ආසියාවේ හා අග්නිදිග ආසියාවේ හා ආසන්න ප්‍රදේශවල යුරෝපීයයන් පැමිණීමට පෙර මුස්ලිම් වූ ප්‍රදේශ එතරම් විශාල නො වේ. ඇෆ්ගනිස්ථානය පකිස්ථානය ආදී ප්‍රදේශවල මුල් බැසගත් සජාතීය සංස්කෘතියක් තිබිණි යැයි සිතිය නො හැකි ය. මාලදිවයිනේ ද සියවස් කිහිපයක් පැරණි නෛසර්ගික සංස්කෘතියක් නො තිබුණි. වත්මන් ඉන්දුනීසියාවේ ද බෞද්ධ සංස්කෘතියක් තිබුණු නමුදු එය ද කෙතරම් මුල් බැසගෙන තිබුණේ ද යන්න ප්‍රශ්නයකි. අනෙක් රටවල් මුස්ලිම් කිරීම පිළිබඳ ප්‍රශ්නය පැන නොනගී. කලින් කී පරිදි මුගල් අධිරාජ්‍යයට වුව ද භාරතයේ මුස්ලිම් කිරීමට හැකිවූයේ සුළු ප්‍රදේශයකි. භාරතයේ හින්දු සංස්කෘතිය සියවස් ගණනාවක විකාශයෙන් පසුව මුල් අල්ලා තිබුණි. ලංකාවට දකුණු ඉන්දියාවෙන් පැමිණි දෙමළ කතාකළ මුස්ලිම් ජනයා දේශපාලන ආධිපත්‍යයක් පවා නොමැතිව සිංහල බෞද්ධ ලංකාව මුස්ලිම් කිරීම ඊළාම් සිහිනයටත් වැඩි දවල් සිහිනයක් පමණක් ම විය.

මහාචාර්ය නලින් ද සිල්වා

© Prof. Nalin De Silva